කෑඳෑත්තා

ශ්‍රී ලංකා ක්ෂේත්‍ර පක්ෂි විද්‍යා කවයේ සිංහල ප්‍රකාශනයයි. 2012 ජනවාරි කලාපය

කුරුළු පෙදෙස්

වැදගත් කුරුළු පෙදෙස් 117 ක් අප රටතුළින් හඳුනාගෙන තිබේ. මෙම ස්ථාන ගැන සිතියමක් "ශ්‍රී ලංකා කුරුල්ලෝ" අත් පොතෙහි දැක්වේ. අභය භූමි, රක්ෂිත ප්‍රදේශවලට අමතරව අලුත් ප්‍රදේශ 52 ක් පමණ වැදගත් කුරුළු ස්ථාන හැටියට ගැනේ. රටේ පවතින වනජීවී රක්ෂිත සහ වන රක්ෂිත කිහිපයක් ද වැදගත් කුරුළු පෙදෙස්වලට ඇතළත් වේ.

කුරුළු කලාප 5 ක් ද අප දිවයිනේ හඳුනාගෙන ඇත.

1. ඉන්දියානු කුරුළු කලාපය
2. තෙත් පහත රට කුරුළු කලාපය
3. ඌව කුරුළු කලාපය
4. කඳුරට කුරුළු කලාපය
5. මැද රට කුරුළු කලාපය

කුරුළු පෙදෙස් අතරට ගැනුණු ස්ථාන සඳහා ආදම් පාලම, ගම්පහ පිලිකුත්තුව, කොළඹ බේරේ වැව, මුතුරාජ වෙල, යාපනේ කලපුව, හල්දුම්මුල්ල ඔසු උද්‍යානය ලේඛණයට ඇතුළත් කර තිබීම විශේෂ කරුණකි.

අන්තර්ජාතික සමුළුව

සමූහ-පක්ෂීන් හා වනාන්තර සංරක්ෂණය සඳහා වූ අන්තර්ජාතික සමුළුව අගෝස්තු මස 5 වන දා සිට 10 වන දක්වා රත්නපුර රත්නාලෝක සංචාරක නිකේතනය හා සිංහරාජ ලෝක උරුම වානාන්තරය ප්‍රමුඛ කොට ගෙන පවත්වන ලදී. මෙම සමුළුව කොළඹ විශ්වවිද්‍යාලයේ ශ්‍රී ලංකා ක්ෂේත්‍ර පක්ෂිවිද්‍යා කවය මගින් සංවිධානය කරන ලද අතර විවිධ රාජ්‍ය නොවන සංවිධානවල අනුග්‍රහය ද මේ සඳහා ලැබුණි.

සමුළුවේ ප්‍රධාන අරමුණ වූයේ, ලෝකයේ විවිධ රටවල සමූහ පක්ෂීන් පිළිබඳ පර්යේෂණ පවත්වන විද්‍යාඥයින් මෙන්ම පර්යේෂණයේ යෙදී සිටින සිසු සිසුවියන් එක් රැස් කිරීම හා පර්යේෂණයේ යෙදී සිටින විද්‍යාඥයින් අතර පොදු එකඟතාවයන් ඇති කර ගැනීමත්ය.

මේ සඳහා ලෝකයේ රටවල් කිහිපයක (ඇමරිකා එක්සත් ජනපදය, පින්ලන්තය, ඉන්දියාව, මැලේසියාව හා කොලොම්බියාව) විද්‍යාඥයින් සහභාගී වන ලදී. මහාචාර්ය සරත් කොටගම මහතා සමුළුවේ මුලසුන හොබවන ලද අතර "ශ්‍රී ලංකාවේ පක්ෂි පර්යේෂණ ඉතිහාසය" පිළිබඳ දේශනයකින් සමුළුව ආරම්භ කරන ලදී. ආචාර්ය දේවක වීරකෝන් මහතා ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වය පිළිබඳවත් රාහුල පෙරේරා මහතා පක්ෂීන් හා ඔවුන්ගේ චමත්කාරය පිළිබඳවත් සම්පත් වාහල මහතා සිංහරාජ වනාන්තරයේ විවිධත්වය පිළිබඳවත් දේශන පවත්වන ලදී.

මෙම වැඩමුළුව සඳහා කොළඹ විශ්වවිද්‍යාලය, රජරට විශ්වවිද්‍යාලය, සබරගමු විශ්වවිද්‍යාලය සහ විවෘත විශ්වවිද්‍යාලය යන විශ්වවිද්‍යාලවල සිසුන් සහභාගී වූ අතර, විද්‍යාඥයින්ගේ ඍජු දායකත්වය ද ලැබිණි.

මෙම සමුළුවේ සාර්ථකත්වය මත අනාගතයේ බොහෝ විශ්වවිද්‍යාල සිසුන් සමූහ-පක්ෂි පිළිබඳ අධ්‍යයනය හා ලංකාවේ ජෛව විවිධත්වයට අදාල පර්යේෂණ සඳහා යොමුවෙතැයි ශ්‍රී ලංකා ක්ෂේත්‍ර පක්ෂිවිද්‍යා කවයේ මාහැඟි බලාපොරොත්තුවයි.

කතුවැකිය

පොතකින්-පතකින්
ගසකින්-වැලකින්
මුමුණන
අත්දැකීමේ
පෙළ පොත,
පාසල්-විශ්වනිකේතන
පරයා ගොස්
සමාජය අත්විඳි

සිත, ඒ
කොහේ සැරිසැරුවත්
උඹේ පිහාටුවක රැඳි
උණුසුම හා සෙනෙහස
යලි කිසි තැනක
මා ස්පර්ශ නොකළෙමි.

සුන්දරත්වය
සෙනෙහස
දරාගැනීම
පමණක් නොව
සියලු අත්දැකීම්
අනාගත පරපුරේ
පැවැත්ම උදෙසා
කැප කිරීම
එක් තැනකදී
මා දුටුවානම්
ඒ විජයග්‍රාහී තිළිණයේ
පාරිශුද්ධ හිමිකරුවා
කැදැත්තෝ .... නුඹයි.

ශ්‍රී ලංකා ක්ෂේත්‍ර පක්ෂිවිද්‍යා කවයේ සිංහල නිල ප්‍රකාශනය වේ.

සංස්කරණය-අරුණ පද්මපෙරුම

පිටු සැකසුම-ඉන්ද්‍රික කග්ගොඩආරච්චි
අකුරු ඇමුණුම-ශ්‍යාමා වීරකුලසූරිය

උපදේශනය-මහාචාර්ය සරත් කොටගම
ස්තුතිය-ආචාර්ය දේවක වීරකෝන්
කසුන් සලීන්ද්‍ර දයානන්ද
සමන් ගමගේ
සෝදුපත් බැලීම-සාන්ත උදයකුමාර,
සුසන්ත සංජීව
ශ්‍රී ලංකා ක්ෂේත්‍ර පක්ෂිවිද්‍යා කවය
සත්ත්ව විද්‍යා අංශය
කොළඹ විශ්වවිද්‍යාලය
කොළඹ 03.
ටෙලි: 0112501332,0112592609
ෆැක්ස්: 0112592604
ඊ-මේ: fogsl@slt,lk
වෙබ්: fogsl.net

කුරුල්ලන් තවදුරටත් තර්ජනයට........................

කුරුල්ලන් වඳවීමට ලක්වීමේ අවදානම තවදුරටත් ඉහළ යමින් පවතින බව කුරුලු ජීව ජාත්‍යන්තරය විසින් සිදුකළ නවතම අධ්‍යයන මගින් හෙළි වී තිබේ.

කුරුලු රටාසමයන් 1227ක් එනම් ලෝකයේ සිටින මුළු කුරුලු රටාසමයන් සංඛ්‍යාවෙන් 12%ක් ගෝලීය වශයෙන් තර්ජනයට ලක් වී ඇත.

අති අන්තරාය (Critically Endanger) කාණ්ඩයට අයත් වන කුරුලු රටාසම ගණන 192 කි. එනම් 2008 වසරට සාපේක්ෂව කුරුලු රටාසමයන් දෙදෙනෙකුගේ වැඩි වීමකි.

මෙම අධ්‍යනයට අනුව රටාසමයින් 362ක් අන්තරාය (Endanger) කාණ්ඩයට ද රටාසමයන් 669 ක් අවදානම් (Vulnerable) කාණ්ඩයට ද අයත් වේ. එසේම රටාසමයන් 133ක් වඳවී ඇති බවද (Extinct) සොයාගෙන ඇත. තවද කුරුලු රටාසමයන් 835ක් ආසන්න තර්ජිත (Near Threatened) ලෙස වර්ගීකරණය කර ඇත.

කෙසේ වෙතත් නිවැරැදිව සිදු කරන ලද සංරක්ෂණ ක්‍රියාදාමයන් හේතුවෙන් ඇතැම් කුරුලු රටාසමයන් වඳ වීමට ලක්වීමේ අවදානම අඩුකර ගැනීමටද පක්ෂි විද්‍යාඥයන් සමත් වී තිබේ. බ්‍රසීලයේ ජීවත් වන ලියර්ගේ මැකෝ ගිරවා (Lear's macaw) අති අන්තරාය කාණ්ඩයේ වර්ග කර තිබුණේ ඉතා කුඩා ගහණයක් පැවතීම හේතුවෙනි. එම කුරුලු ගහණය හතර ගුණයකින් වැඩි කර ගැනීමට එරට රජය, සංරක්ෂණ සංවිධාන සහ ජනතාවගේ සහයෙන් ක්‍රියාත්මක කරන ලද සංරක්ෂණ වැඩසටහන නිසා හැකි වී තිබේ. ඒ හේතුවෙන් මෙම අලංකාර නිල් පැහැති මැකෝ ගිරවා අති අන්තරාය කාණ්ඩයෙන් පහළ කාණ්ඩයට එනම් අන්තරාය කාණ්ඩයට එක් කර ඇත.

අප බොහෝවිට සිතන්නේ තර්ජනයට ලක්වන්නේ දුලබ කුරුල්ලන් පමණක් බවයි. නමුත් බොහෝ ස්ථාන වල විශාල සංඛ්‍යාවලින් සිටින කුරුලු රටා සමයන්ද තර්ජනයට ලක් වේ. පොදුවේ නිතර දකින කුරුල්ලන්ගේ සංඛාව අඩු වී නිතර දකින්නට නොලැබෙන තත්වයට පත් වීම අප අත්දැක තිබේ. උදාහරණයක් ලෙස අතීතයේ අප නිතර දුටු "ගේ කුරුල්ලන්"(House Sparrow) අද දකින්නට ලැබෙන්නේ සීමිත ප්‍රදේශයක කුඩා සංඛ්‍යා වලිනි. නිතර දකින නිසාම මෙම කුරුල්ලා ගැන සෙවීම අතපසු කිරීම මොනතරම් අකටයුත්තක්ද?

කෙන්යානු ගිජුලිහිණියන්ගේ ගහණයේ සීඝ්‍ර අඩුවීමක්

අප්‍රිකාවේ සුවිශේෂී වූ වන ජීවී සාමාජිකයෙකු වන ගිජුලිහිණියන්ගේ සීඝ්‍ර අඩුවීමක් දක්නට ලැබේ. මේ බව ජීව විද්‍යා සංරක්ෂක සඟරාවේ පළවූ ලිපියක සඳහන් වී ඇත. පර්යේෂකයන් සොයාගත් දත්ත අනුව නිතඹ සුදු ගිජුලිහිණියා (*Gyps africanus*), රූපෙල් ගිජුලිහිණියා (*Gyps rueppelli*), තට්ට ගිජුලිහිණියා (*Necrosyrtes monachus*) යන ගිජුලිහිණියන් මසයිමාරා වන උද්‍යානයේ (නිරිතදිග අප්‍රිකාවේ-කෙන්යාවේ) දශක තුනක් තිස්සේ 60% කට වඩා අඩුවී ඇති බව සොයාගෙන තිබේ.

මෙයට මූලිකම හේතුව වී ඇත්තේ භූමි පරිහරණයේ ඇති අක්‍රමිකතා සහ විශාල විලෝපිකයන්ගෙන් ගොවිපල සතුනට වන හානිය නැති කිරීමට මලකුණුවලට විෂ යෙදීම නිසා මෙම ගිජුලිහිණින් ඒ විෂ අන්තර්ගත මලකුණු ආහාරයට ගැනීම යන කාරණා දෙකයි.

පර්යේෂණයට ලක් කළ ගිජුලිහිණි රටාසම අටෙන් හතක්ම තම ගහනය අඩුවීමේ තර්ජනයට මුහුණුපා ඇති බවත්, සුදුසු භූමි පරිභෝජන රටා ඇතැම් විෂ රසායන ද්‍රව්‍ය තහනම් කිරීම මඟින් මෙම කසල සෝදක මූලස්ථාන විශේෂ ආරක්ෂා කරගත හැකි බව උප කර්තෘ "මුනීර් විරානි" පවසයි.

කෙන්යාවේ උද්ගතවී ඇති මෙම තත්ත්වයට සමාන තත්ත්වයක් නැගෙනහිර අප්‍රිකාවේද පවතින බව ඔහු පවසයි. ගොදුරු කුරුල්ලන්ගේ පර්යේෂණ පිළිබඳව වූ විද්‍යාත්මක සඟරාවක මධ්‍යම කෙන්යාවේ කරන ලද පර්යේෂණයකින් කසල සෝදක පක්ෂීන්ගේ ගහනයන් (විශේෂයෙන් ගිජුලිහිණියන්) 70% වඩා අඩු වී ඇති බව සොයාගෙන තිබේ. ආහාර හා දේශගුණය මොවුනට සීමාකාරී සාධක නොවන බවත්, විෂ කවන ලද මළකුණු මේ සඳහා ප්‍රධානතම හේතුව බවත් විද්‍යාත්මක ලිපියේ කර්තෘ සඳහන් කරයි.

බොහෝ ප්‍රදේශවල ගොවිපොල හිමියන් විසින් "ෆර්ඩාන" නම් කෘමිනාශකය නොමනා ලෙස, සිංහයන් සහ අනෙකුත් විශාල විලෝපිකයන් මරණයට පත් කිරීමට යොදාගනිති. ඒ එම ගොවීන්ගේ ගොවිපල සතුන් මෙම විශාල විලෝපික සතුන්ගෙන් බේරාගැනීම සඳහායි. ඔවුන් විෂ අන්තර්ගත කරන ලද මළ සිරුරු තැන තැන දැමීම තුලින් ඒවා සෘජුවම ගිජුලිහිණියන්ගේ ආහාර බවට පත් වේ. ගිජුලිහිණින් රංචු ලෙස හැසිරෙමින් මළකුණු ආහාරයට ගන්නා නිසා විෂ අන්තර්ගත කරන ලද එක් මළ සිරුරකින් ගිජුලිහිණින් විශාල ප්‍රමාණයක් මිය යයි.

"ෆර්ඩාන් සහ ඩයික්ලෝෆිනැක්" වැනි රසායනික ද්‍රව්‍ය කෙන්යානු වෙළඳපොලෙන් ඉවත් නොකලහොත්, කෙන්යාව සතු මුළු ගිජුලිහිණි ගහනයම නැතිවනු ඇති බව "නේචර් කෙන්යා" (Nature Kenya) ආයතනයේ විධායක අධ්‍යක්ෂක "පෝල් මටිකු" මහතා පවසයි. අන්තර්ජාතික කුරුළු සංගමයත් අප්‍රිකානු මාවුජ් වැඩසටහන සහ අප්‍රිකාව පුරා ඇති අනෙකුත් සංවිධානත් එකතුව ඉතා සීඝ්‍රයෙන් උත්සන්න වන මෙම ගැටළුව සම්බන්ධයෙන් විසඳුම් සෙවීමට ක්‍රියාත්මක වී සිටිති.

කෙසේ නමුත් ලොවපුරාම සිටින සමස්ත පක්ෂීන්ගේ ගහන වල අඩුවීම පක්ෂි ලෝලීන් වශයෙන් අපි සියළුදෙනාගේම අවධානයට ලක්විය යුතු කරුණක් බව අවධාරණය කරමින් එය වැලැක්වීම හෝ නිසි විසඳුම් සෙවීමට තමතමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් කටයුතු කිරීමට සූදානම් වෙමු.

සලින්ද්‍ර කසුන් දයානන්ද-fogsl
උපුටා ගැනීම- SPECIES NEWS/ Bird Life International

කවුඩා Drongo

රට පුරාම දැකීමට ලැබෙන කුරුලු රටාසමයෙකි. රටාසමයන් ගණනාවක් විසුව ද සියලු දෙනා අමතන්නේ "කවුඩා" ලෙසටය. කපුටු බාලයා, කපුටු පනික්කියා ලෙස ද නම් ගෙතී තිබේ. කෘමීන් ඩැහැ ගැනීමේදී මෙම පක්ෂියා ගුවන සිසාරා දක්වන දස්කම්, "කවුඩා හා ජන ජීවිතය අතර සබඳතා" ගැන ලියැවුණු පොත-පතෙහි ඕනෑකමින් දක්වා ඇත.

DICRURIDAE පවුලට කවුඩු රටාසමයන් සියලු දෙනා ඇතුළත්ය. මොවුන් කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ තරමකින් හෙබි කුරුලු වර්ගයෝය. පොදුවේ ගත්කල කළු පැහැයෙන් යුක්තය. වලිග පිහාටු වල හැඩතල විවිධත්වයක් ගනී. ඇතැම් කවුඩන්ගේ වලිගය, මාළුවෙකුගේ පසුපස වරල සේය. කරවල පෙන්දා යන නම ලැබූ කවුඩන්ට ඇත්තේ එවැනි වලිගයකි. ඇතැම් කවුඩන්ගේ Racket පිත්තක සිරිය උසුලයි. වලිගයට අමතරව හිසෙහි අලංකාරයට එකතු වූ පැළඳුම් ද තිබේ. හිස මුදුනෙහි දික්වූ කෙටි පිහාටු ඇතැම් කවුඩන්ට උරුමය (with crest or elongated plumes on head).

ගන (Genera) දෙකකට අයත් කුරුලු රටාසමයන් 26 ක් පමණ ලොව වෙසෙති. එහෙත් අලුත් ලෝකයේ හමු නොවේ. දැනට වසර 400 පමණ කාලයක සිට කවුඩන් ගැන උනන්දු වූ විද්‍යාඥයන් පවසන එක් කරුණක්, මේ සමග සඳහන් කිරීම ඉතා කාලෝචිත වීමට පුළුවන. එනම් හඳුනාගත් කිසිදු කවුඩු වර්ගයක් වර්ෂ 1600 සිට වඳවී නොගොස් ඇති බවත් එහෙත් වර්ග දෙකක් තර්ජනයට පත් වී ඇති බවත් ය.

ගෝචර පරිසරය-Habitat

කවුඩු පවුලේ සාමාජිකයන් විශේෂයෙන්ම හමුවන්නේ නිවර්තන හා උප නිවර්තන පරිසර පද්ධති සමගිනි. ගස් වැල් සහිත පරිසර අභිමුවෙනි. නොඉදුල් වනාන්තර, ද්වීතීක වනාන්තර, වැවිලි වගා පද්ධති, සවානා බිම්, වනාන්තර අද්දර හා ග්‍රාමීය ඉඩකඩම්වල කවුඩන් දැකීමට ලැබේ. බොහෝ කවුඩන් වර්ග විවෘත පරිසර පද්ධති ප්‍රියකරන්නේ ගුවනේ සැරිසරන කෘමීන් ආහාරයට ගැනීමට ඇති පහසුතාවය නිසාය. එසේම ඔවුන් විවෘත පරිසරයේ හමුවන හුදකලා ගස් හෝ උපස්තරමත වැඩිපුර ලැගුම් ගනී.

නාදය-Voice

කවුඩා නාද විවිධත්වයකට හිමිකම් දක්වන පක්ෂි වර්ගයකි. ස්වර ප්‍රයෝග දැක්වීමට උපන් රුසියෙකි. බොහෝ සතුන්ගේ නාද අනුකරණය කිරීම මෙහි අදහසයි. සමහරවිට විවිධ ශබ්ද කීපයක් කලවම් කර ඉදිරිපත් කරයි. සංකර නාද රටා ඉදිරිපත් කිරීම ලෙස මෙය හඳුන්වයි.

කවුඩන් ආහාර සෙවීමේදී යොදා ගන්නා ක්‍රමයකි, චෞර පරපෝෂීභාවය. කුරුලු රංචුවක පෙරටුගාමී පක්ෂියා කවුඩාය. කුරුලු නඩයට රැකවරණය දීම මොහුගේ එක් කටයුත්තකි. රංචුවේ වෙනත් කුරුලු වර්ගයක පක්ෂියෙකු ආහාරගෙන ඌට එය හසුරුවා ගැනීමට අපහසු නම් කවුඩා එය උදුරා ගනී. එසේ නැතිනම් ව්‍යාජ අඩහැර පාමින් ආහාරය අතහැර දමායන තැනට කුරුල්ලා පත් කර එම ආහාරය කවුඩා විසින් ලබා ගනී.

කුරුලු නඩයකට මග පෙන්වීමේදී කෑම සෙවීමට තරම් වේලාවක් කවුඩාට නොමැති නිසා සිදු කරන ආක්‍රමණශීලි ආහාර ලබාගැනීම විටක සාධාරණීකරනයට ද කරුණු තිබේ. කවුඩා පුංචි කුරුලු පැටවුන් පවා ආහාරයට ගනී.

වගා කටයුතු වලට හානි පමුණුවන කෘමීන් ඩැහැගැනීම කවුඩාගේ මූලික මෙහෙවරයි. අළුයම 6 සිට ඉර බැස යන තුරු මෙම මෙහෙවර සිදු කරයි. පරිසරයට නොමද මෙහෙයක් කරන කවුඩා, එවැනිම ප්‍රයෝනවත් සතෙකු වූ මී- මැස්සන් පවා ආහාරයට ගැනීමට යොමු වීම තුළ කරන හොඳ දේවල් සැඩ පහරේ ගසා ගියා වගේ කටයුතු පවා සිදු වේ. කවුඩන් (වර්ග) රටාසමයන් ගණනාවක් අප රටේ වෙසෙති.

කවුඩා *Dicrurus caerulescens*
White-bellied Drongo

රටේ කවුරුත් දැන හඳුනන කවුඩු වර්ගය මොහුය. තද නිල් කළු සිළුටු උඩු කයකි, පැටවුන් ළා කළු පාටය. වියළි කලාපයේ වසන කුරුල්ලන්ද ළා කළු පාටය. ගැඹුරු ලෙස දෙබල් වූ වලිගයකි. හොටය මදක් නැමී ඇත. වලිගයත් ගතත් වැනීමේ හැසිරීම සහ ගොදුරු අල්ලාගෙන නැවතත් වසා සිටි ස්ථානයටම පැමිණීම විශේෂ චර්යාවකි. වෙනත් කුරුල්ලන්ගේ හා බළලුන්ගේ නාදයට සමානව නාද කිරීම මෙම කුරුල්ලන්ගේ ගතියුරකි.

සුවැඳි සමය පෙබරවාරි සිට මැයි දක්වාය. ඇරුණු කූඩුවක් සාදයි. ලයිකන, රොඩු, පිහාටු, මකුළු දැල් යනාදිය මගින් කෝප්පයක ස්වභාවයෙන් මැදි තරමේ අත්තකට ඇලෙන පරිදි කූඩුව තනයි. කුරුල්ලා කූඩුවේ ඉඳගෙන සිටින විටක මිස කූඩුව සොයා ගැනීම ඉතා අසීරුය. බිත්තර 2 ක් හෝ 3 ක් දමයි.

කළු කවුඩා *Dicrurus macrocercus*
Black Drongo

මුළුමනින්ම සිළුටු තද කළු කුරුල්ලෙකි. ගත සිහින්ය. වලිගය ගැඹුරු ලෙස දෙබල්ය. වලිගයේ පිටත පිහාටු කෙරවල යන්තමින් ඉහළට නැමී ඇත. බෙහෙවින් සමාන සොබාවැති කවුඩා ගෙන් වෙන් කර ගත හැක්කේ මොහුගේ වඩා තද පාට පිල් කළඹෙන් සහ වඩා දිග වලිගයෙනි. පියාසර කරන ඇවරී පිහාටු වල අළුවන් හෝ දුඹුරුවන් පැහැය පැහැදිලිව දිස් වේ. යුවළක් ලෙසින් හැසිරේ. සුවැඳි සමයට කූඩුව අවට පෙදෙස ඉතා දැඩි ලෙස රැක ගනී. ඒ අසලට පැමිණෙන සෑම පරගිලියන් හෝ ලොකු කුරුල්ලන් හෝ එළවා දමති. සුවැඳි සමය මාර්තු සිට මැයි දක්වාය. සමහර විට ඊට කලින් ඇරඹේ.

ඇරුණු කූඩුවකි. ලයිකන, කෙඳි හා පිහාටු මුසු කොට ගෙන කෝප්පයක් වැනි කුඩා කූඩුවක් මැදි තරමේ අත්තකට ඇලෙන සේ තනයි. කුරුල්ලා බිත්තර රැකීමට එහි ඉඳගත් විට කූඩුව නොපෙනෙන තරම්ය. තරමෙන් සෙමී. 24/18 වූ ලොකු පැත්තේ දුඹුරු පැල්ලම් හා පුල්ලි වැඩියෙන් පවතින, සුදු හෝ ළා රෝස පැහැති බිත්තර 2-3 ක් දමයි. එළි බිම්, කැලෑ, ලඳු කැලෑවල ගැවසේ. සුලබයි. සුවැඳි නිවැසියෙකි. පහතරට වියළි කලාපයේ පැතිරේ. වෙසෙසින් උතුරු පෙදෙසේ එනම් මන්නාරමෙන් ඉහළට යාපනය දක්වා වෙරළබඩව බොහෝමයක් සිටිති. ඉතා මෑතක සිට නැගෙනහිර පෙදෙසේ ද රට ඇතුළත සමහර තැන්වල වාර්තා වී ඇත.

අළු කවුඩා *Dicrurus leucophaeus*
Ashy Drongo

උඩු කය තද අළු පැහැයේ සිට ළා අළු පැහැය දක්වා වේ. යටි කය වඩා ළා පාටය. නොදිලෙන සුලුය. වලිගය ගැඹුරු ලෙස දෙබල් වී ඇත. ඇසි පැහැය ලේ වන් රතුය. කැලෑ, ලඳු කැලෑ වල ගැවසේ. දුලබයි. නිහැරියෙකි. පහතරට (නැගෙනහිර පෙදෙසේ බොහෝ ලෙසින්) පැතිරේ.

සිළු මහ කවුඩා *Dicrurus lophorinu*
Sri Lanka Crested Drongo

අති දිළෙන කළු ගත සහ දිගු වලිගයේ ගැඹුරු දෙබල් සොබාව මොවුන් පැහැදිලිව හඳුනා ගැනීමට උදව් වේ.

කැලෑවල පමණක්ම දැකිය හැකිය. මේ කුරුල්ලන්ගේ නාදය ඉතා තියුණුය. වනයේ නිහඬතාව මේ නාදයෙන් බිඳ වැටේ. විටෙක යකඩයකට තව යකඩයකින් ගසන්නාක් සේ ද නාද කරයි. ආහාර ගැනීමේදී අන් කවුඩන් මෙන් හැසිරේ. වර්ෂා වනාන්තරවල සැරිසරන, බුදින රැලෙහි මුල් පෙළේ කුරුල්ලෙකු ලෙස සැලකේ. වලිගය හොඳින් දෙබල් වී ඇතත්, පිත්තක සොබාව නොමැත. නළල ළඟින් වූ සිළු ඉතා පැහැදිලිය. සුවැඳි සමය මාර්තු සිට මැයි දක්වා වේ. ඇරුණු කූඩුවකි. කෝටු, කෙඳි, මකුළු දැල් යොදා ගස් කරුවක තනා ඇති කූඩුව කුඩා කෝප්පයක් වැනිය. බිත්තර වල තරම, පැහැය හා ගණන පිතිපෙද මහ කවුඩාගේ මෙනි.

කැලෑ, ගඟබඩ කැලෑවල ගැවසේ. සුලබයි. තැන්වැතියෙකි. පහතරට තෙත් කලාපයේ වාසය කරයි.

මුලින් මහ කවුඩාගේ උප රටාසමයන් දෙදෙනෙකු ලෙස,

- සිළු මහ කවුඩා
- පිතිපෙඳ මහ කවුඩා

ලෙස හැඳින්වූ අතර මෑතකදී ප්‍රකාශයට පත් කරන ලද විදුහුරු ප්‍රතිකාවලට අනුව මහ කවුඩා ලෙස පක්ෂියෙකු නොමැති අතර, ඒ වෙනුවට සිළු මහ කවුඩා සහ පිටිපෙඳ මහ කවුඩා යනුවෙන් රටාසමයන් දෙදෙනෙකු නම් කර ඇත. මෙයින් ඉහතින් විස්තර කළ සිළු මහ කවුඩා මුළු ලොවෙන්ම ශ්‍රී ලංකාවට තැන්වැති පක්ෂියෙකු ලෙස නම් කර තිබේ.

පිතිපෙඳ මහ කවුඩා

Dicrurus paradiseus ceylonicus

Greater Racket-tailed Drongo

වලිගයේ පිටත පිහාටු දික් වී සිහින් පිති දෙකක් වැනි සොබාවක් ගනී. නළලේ සිළුව එතරම් ලොකු නැත. සුවැදි සමය අප්‍රේල් සිට මැයි දක්වා වේ. ඇරුණු කූඩුවකි. කවුඩා ගේ කූඩුවට සමාන වන එය ගසක අත්තක්මත කුඩා කෝප්පයක් ලෙසින් සාදයි. තරමෙන් සෙමී. 27/21 වු අළුවන් දම් සහ රතුවන් රෝස සහිත රෝස වන් සුදුපැහැ බිත්තර 2-4 ක් දමයි. කැලෑ වෙසෙසින් වියළි කලාපයේ උස් කැලෑවල සහ ගඟ බඩවල ගැවසේ. එම ප්‍රදේශවල සුලබයි. සුවැදි නිවැසියෙකි. පහතරට වියළි කලාපයේ ද කඳුරටේ අඩු ලෙසින් ද පැතිරේ.

Dicrurus paradiseu ගේ උපරටා සමයන් කිහිප දෙනෙකු ලෝකයේ වාර්තා වේ. ඉන් ලංකාවේ වර්තා වනුයේ Dicrurus paradiseus ceylonicu නම් උප රටා සමයායි.

මළ කුණු වලට ගිජු ගිජුලිහිණියන්ගේ මරණය

ඉන්දියානු උප මහද්වීපයේ වසන ගිජුලිහිණියන්ගේ ප්‍රධාන ආහාරයක් වන්නේ, මැරුණු ගවයන්ගේ මාංශය. ඉන්දියාව, නේපාලය හා පකිස්තානය යන රටවල් ගවයන් මැරීමට පෙර Diclofenac නම් වේදනා නාශකය බහුලව භාවිතා කරන අතර මලකුණු වල මෙම ඖෂධය (මෙය නිපදවා ඇත්තේ මිනිසා සඳහාය. සත්ත්වයින්ට එය සුදුසු නොවේ) එක්රැස්වීම හා ගිජුලිහිණියන් විශාල වශයෙන් මෙම මලකුණු ආහාරයට ගැනීම නිසා ඔවුන්ගේ සිරුර තුළ මෙම රසායනිකය තැන්පත් වේ. ඒ හේතුව නිසා ගිජුලිහිණියන් මරණයට පත් වේ. මරණ අනුපාතිකය ද ඉහල ගොස් ඇත. මෙම රසායනික ද්‍රව්‍ය භාවිතය සම්පූර්ණයෙන්ම අත්හල නොහැකි අතර විශාල වශයෙන් දැනුදු නීතියට පටහැනිව භාවිතා කරයි. විද්‍යාඥයින්, විසින් නීතිය බලපැවැත්මට පෙර හා පසුව සන්සන්දනය කරමින් සිදු කරන ලද පර්යේෂණයන්ගේ (2006 සිට 2008 දක්වා) ප්‍රතිඵලයට අනුව ගවයන්ගේ මලකුණු වල 40% Diclofenac රසායනයේ අඩුවීමක් පෙන්වයි. මෙය ගිජුලිහිණියන්ගේ මරණ අනුපාතිකය අඩුකිරීමට හේතුවන බව හා විශේෂයෙන් මෙය *Gyps bengalensis* (White-rumped Vulture) 18% ක් වන අතර මොවුන්ගේ සංරක්ෂණයට නීතිය බලපැවැත්වීමෙන් පමණක් සිදුකල නොහැකි බවද මෙයින් සනාථ වේ.

Gyps bengalensis (White-rumped Vulture)

ශ්‍රී ලංකා ක්ෂේත්‍ර පක්ෂිවිද්‍යා කවය

කුරුලු විෂය සංවර්ධනය කිරීමටත්, කුරුල්ලන් හා ජන ජීවිතය අතර පවතින සබඳතාව තහවුරු කිරීමටත් කැපවූ ආයතනයකි ශ්‍රී ලංකා ක්ෂේත්‍ර පක්ෂිවිද්‍යා කවය.

මාසිකව සිදුකරන ක්ෂේත්‍ර චාරිකා ඉහත අරමුණු පෝෂණය කිරීමට විශාල පිටිවහලක් සපයයි. වර්ෂ 1997 සිට ක්ෂේත්‍ර චාරිකා සංවිධානය කරමින් ඒ සඳහා මැදිහත් වූ ඉන්දික කග්ගොඩආරච්චි සමග එම ගමන් බිමන් ගැන වචනයක් කතා කිරීමට අපි යොමුවීමු. වසර 14 ක කාලයක් අඛණ්ඩව චාරිකා සංවිධානය කිරීමත් ක්ෂේත්‍ර චාරිකා 100 ඉක්මවා සහභාගී වීමත් මෙහිදී සිහි කළයුතු වෙසෙස් කරුණකි.

ප්‍රශ්නය - වැඩිපුරම ක්ෂේත්‍ර චාරිකා ගිය ස්ථාන මොනවාද?

පිළිතුර - සිංහරාජය, බූන්දල, බුත්තල යන පරිසර පද්ධති වෙත වැඩිපුරම ගොස් ඇති අතර අප අඩුවෙන්ම සහභාගී වූ චාරිකා වනුයේ යාපනය, මන්නාරම වැනි ප්‍රදේශයි.

ප්‍රශ්නය - කුරුල්ලන් වැඩිපුරම දුටුවේ කුමන ප්‍රදේශයේද?

පිළිතුර - බූන්දල ජාතික උද්‍යානයේ ක්ෂේත්‍ර චාරිකා මහත් ඵල ප්‍රයෝජන අත්වූ ඒවාය. වැඩිම කුරුල්ලන් වර්ග ප්‍රමාණයක් දැකීමට ලැබිණ. එයට හේතුව ජලජ පක්ෂීන් මෙන්ම වනජ පක්ෂීන් දෙපිරිසම මෙම පද්ධතියේ නේවාසිකව විසීමය.

ප්‍රශ්නය - රංචු වශයෙන් ගත් විට වැඩිම කුරුලු රංචුව දැකීමට ලැබුනේ කොහේදී ද ?

පිළිතුර - එම අවස්ථාව බූන්දල වනෝද්‍යානයටම හිමිවේ. නඩයක් හැටියට ගත් විට වැඩිම ප්‍රමාණය දැකීමට ලැබුණේ තෙත් බිම් පරිසරයෙනි.

ප්‍රශ්නය - එක වර්ගයක කුරුල්ලන් වැඩිපුරම දැකීමට ලැබුණු අවස්ථාව උදා වූයේ කොහේදීද?

පිළිතුර - බූන්දල වනෝද්‍යානයේදී මෙම අවස්ථාව ලැබිණි. රෝස මයිනා Rosy starlins කුරුල්ලන්ගේ විශාල ගහණයක් දැකීමට ලැබිණ.

ප්‍රශ්නය - අඩුවෙන්ම දුටු කුරුලු වර්ගය කවරෙක්ද ?

පිළිතුර - යාල වනෝද්‍යානයේදී දැකීමට ලැබුණු අලි මානාවන් (Black-nacked stork) දෙදෙනා නිරීක්ෂණය කිරීමට ලැබීම එම දුර්ලභම අවස්ථාවයි.

ප්‍රශ්නය - අමතකම නොවන අවස්ථාවක් ගැන මතකයට නැගුවහොත් ?

පිළිතුර - ලංකාවේ දැනට වර්තා වන තැන්වැති කුරුල්ලන්ගේ ප්‍රමාණය වර්ග 27 කි. එම සියලු වර්ග ඇස් දෙකට දැකීමට ලැබීම අමතක නොවන සිදුවීමකි.

ශ්‍රී ලංකාවේ මකුළුවෝ

මකුළුවන් සන්ධිපාදික (Arthopoda) වංශයට අයත්වන අතර මොවුන් කෘමීන්ගෙන් වෙන් කර ගැනීමට ලක්ෂණ බොහෝමයක් උපකාරීවේ. කෘමීන් දැල් නොවියන අතර මකුළුවන් දැල් වියන්නන් අතර ප්‍රමුඛම ස්ථානයක් ගනී. එමෙන්ම කෘමීන්ට පාද යුගල් 3 ක් හා ස්පර්ශක යුගලක් පවතී. මකුළුවන්ට පාද යුගල් 4 ක් සහ ස්පර්ශක නොපවතී. තවද කෘමියකුගේ දේහය හිස උරස හා උදරය ලෙස කොටස් 3 කට බෙදෙන අතර මකුළුවකුගේ දේහය කොටස් 2 කට බෙදේ. එනම් ශීර්ෂෝරසය සහ උදරය වේ. මකුළුවන් සතුව පවතින තවත් සුවිශේෂී ලක්ෂණයක් වනුයේ ඇස් 2 සිට 8 තෙක් සංඛ්‍යාවක් පැවතීමයි. උක්ත කරුණු මගින් යමෙකුට කෘමියකුගෙන් මකුළුවකු පහසුවෙන් හඳුනාගත හැකිය.

ශ්‍රී ලංකාව තුළ මකුළු අධ්‍යයන ඉතිහාසය, අනෙකුත් බොහෝ සත්ත්ව කොට්ඨාශවල සේම බ්‍රිතාන්‍ය යටත් විජිත සමය තෙක් දිව යයි. මූලික වශයෙන් පිකාඩ් (Pickard) නැමැත්තාත් පොකොක් (Pocock) නැමැත්තාත් පුරෝගාමී මකුළු විද්‍යාඥයන් වේ. පසුව ශ්‍රී ලාංකික මකුළු විද්‍යාඥයන් ලෙස විජේසිංහ, සුරේෂ් පී. බෙන්ජමින් වැනි විද්‍යාඥයන් හඳුන්වා දිය හැකිය. මොවුහු මේ වන විටත් ශ්‍රී ලාංකීය මකුළු විද්‍යාවට අමිල මෙහෙවරක් කරමින් සිටිති.

මේ වන විට ලංකාව තුළ විද්‍යාත්මකව සනාතව ඇති මකුළු විශේෂ ගණන 501 පමණ වන අතර කුල 46 කට අයත් වේ. මොවුන් අතර දිවි මකුළුවන්, විවෘත දැල් වියන්නන්, මල් මකුළුවන්, කකුළු මකුළුවන්, පිනුම් මකුළුවන් සහ පැතලි කදන් මකුළුවන් වැනි නානාප්‍රකාර දේහ විලාසයන්ගෙන්, චර්යාවන්ගෙන් හා වර්ණයන්ගෙන් යුතු මකුළුවන් සමන්විත වේ. මේ වන විට ලංකාව තුළ මකුළු රටාසමයන් 4000 කට වඩා සිටිය හැකි බවට මකුළු විද්‍යාඥයන් අනුමාන කර ඇත. කෙසේ වෙතත් වර්තමානයේ පවතින පරිසර ගැටළු සමග මෙම අගනා මකුළු සම්පත ගවේෂණයක් කිරීමටත් ප්‍රථම වඳවී යෑමේ තර්ජනයක් පවතී. එබැවින් මොවුන් ගැන තොරතුරු සොයා ගැනීමට දායකවීම මගින් මොවුන් සංරක්ෂණයට ඔබටත් එක්විය හැකිය.

සලීන්ද්‍ර කසුන් දයානන්ද

FOGSL

කැඳැත්තා

කුරුලු පාදයේ ප්‍රයෝජන

01. ගමන් කිරීම සඳහා
02. ලැගීම සඳහා
03. සටන් කිරීමේ හැකියාව (කුකුළා)
04. ආහාර අල්ලා ගැනීමට
05. පහුරු ගා කෑම සෙවීමට
06. ආරක්‍ෂා වීමට (පැස්බරා)
07. පියෑඹීමට බලය ගැනීමට
08. එල්ලීමට (තුරිතයා)
09. දඩයම් කිරීමට
10. පිහිනීමට
11. කූඩුව සෑදීමට
12. වාසස්ථාන වෙන් කිරීමට
13. විසුම් බිම් පෙදෙස වෙන් කිරීමට

අලුත් පොත්



ශ්‍රී ලංකා කුරුල්ලෝ අත්පොත



පරිසරයට කවුලු දොරක්

ශ්‍රී ලංකාවේ වාර්තා වන සියලුම කුරුල්ලන් 494 දෙනා පිළිබඳව වර්ණ රූප සහිතව හඳුනාගැනීමේ ඉඟි සපයන ක්ෂේත්‍ර අත්පොතකි. සෑම කුරුල්ලෙක් පිළිබඳව වර්ණ රූපයක් තිබීම මෙහි විශේෂත්වයකි. කොළඹ විශ්ව විද්‍යාලයේ සත්ත්ව විද්‍යා අංශයේ, ශ්‍රී ලංකා ක්ෂේත්‍ර පක්ෂි විද්‍යා කවයෙන් මෙම ග්‍රන්ථය මිලදී ගැනීමට පුළුවන.

කොළඹ රාජකීය විද්‍යාලය තුළ ක්‍රියාත්මක කරන ලද විශේෂ පරිසර දේශන ගණනාවක් අළලා මෙම පොත මුද්‍රණය කොට තිබේ. විෂය සමගාමී අධ්‍යාපනයට උදව්වක් ලෙසත්, සිසු ජීවන ආකල්ප යහපත් කිරීම සඳහාත් ඉදිරිපත් කරන ලද දේශන 22 ක් ඇතුලත් කර තිබේ.

තායිලන්තයේ වෙසෙන වර්ණවත්ම පක්ෂියෙක්

තායිලන්තයේ වෙසෙන වර්ණවත්ම පක්ෂියෙක් වූ තායිලන්ත ගමන් අවිච්චියා වසර 25 කට පෙර නැවත සොයා ගත්තේ මහත් බලාපොරොත්තු ඇති කරමිනි. මෙම පක්ෂියා දැඩි තර්ජනයට පාත්‍ර වූ ජීවියෙකි. 1986 නැවත වාර්තා පොතට ඇතුළත් කර ගැනීමෙන් පසු එවකට සිටි ගහනයෙන් 90% ක් පමණ මේ වන විට මරණයට පත් වී තිබේ. යුගල් 50 ක් පමණ එදා වාර්තා වුවද වර්තමානයේ එය යුගල් කිහිපයකට සීමා වේ. සිටින කුරුල්ලන්ගෙන්ද වැඩි දෙනෙක් ජීවත් වන්නේ රක්ෂිත ප්‍රදේශවලින් මෙපිටය. රට තුළ සීග්‍රයෙන් සිදු වන රබර් වගාවත්, පාම් ඔයිල් වගාවත් මෙම කුරුල්ලන්ගේ ගහනයේ සීග්‍ර අඩු වීමකට හේතු පාදක වේ.